# මොරවැව ප්‍රාදේශීය සභාව

# ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය.

## 1. මූල්‍ය ප්‍රකාශන.

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 සැප්තැම්බර් 05 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 ජූලි 25 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 මාර්තු 21 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

### 1.2 මතය

මගේ පරික්ෂණයෙන් පෙනි යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, මොරවැව ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් ,මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට මොරවැව ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිලිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වු මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) 2011 දෙසැම්බර් 31 දිනට අංක 0002366497 දරන මුදල් පොතේ බැංකු ශේෂය රු. 414,911 ක් වුවද . ගිණුම්වල රු. 2,648,474 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) 2011 දෙසැම්බර් 31 දිනට අත ඉතිරි මුදල් ලෙස රු. 11,546 ඍණ ශේෂයක් බැංකු සැසඳුමට ගළපා තිබුණි.

(ඇ) 2011 දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුම් දෙකක වූ රු.30,432,379 ක ශේෂය ගිණුම්වල දක්වා නොතිබුණි.

### 1.3.2 තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 5,049,361 ක් වූ ගණුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 02. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය.

ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 2,828,063 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 823,146 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය.

බැංකු ගිණුම් සඳහා මුදල් පොත් නිසිලෙස පවත්වාගෙන ගොස් නොතිබූ අතර බැංකු සැසඳුම් ප්‍රකාශන ද නිවැරදිව පිළියෙල කර නොතිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය.

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍යආදායම් සහ හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 89 | 24 | (65) |
| (ii) | බදු කුලී | 580 | 67 | (513) |
| (iii) | බලපත්‍ර ගාස්තු | 136 | 54 | (82) |
| (iv) | වෙනත් ආදායම් | 7,331 | 7,514 | 183 |

2.3.2 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු.</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ මුදල් උසාවි දඩ මුදල් රු1,656,983 ක් විය.

03. <u>පද්ධති හා පාලන.</u>

පහත සඳහන් පද්ධති හා පාලන පිළිබඳ සභාවේ විශේෂ අවධානය යොමු කෙරේ

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය